**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය -2019**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල නව සංශෝධිත පනතේ 22 වගන්තිය යටතේ පනවා ඇති විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලනොවීම.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 සැප්තැම්බර් 05 දින සිට මාස 60 කින් ගෙවා අවසන් කිරීමේ පදනම මත මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ, මණ්ඩලය විසින් ලබාගෙන තිබුණු වාහන දෙක වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතුව රු.14,681,436 ක් වූ බදු හැර අවම කල්බදු වටිනාකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 හි 43 (ආ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාර ව අවශ්‍ය කරන ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ සටහන් අංක 3.04හි මෙහෙයුම් කල්බදු මත කුලී වාහන යටතේ අනාවරණය කර තිබේ.<br>එසේ වුව ද ගිණුම්කරණමය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු නොවී තිබේ. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික සංචිතයක් පිහිටුවීම, සංරක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම එක් ප්‍රධාන කාර්යයක් විය. ඒ අනුව නිත්‍යානුකූල තැන්පතුව, පරිත්‍යාග, මිලදී ගැනීම්, හුවමාරු සේවා යනාදී වශයෙන් | පිරිවැය මත ස්ථාවර වත්කම් ගිණුම්ගත කරන බැවින් මිලදී ගන්නා වත්කම් පමණක් තොගයට ගිණුම්ගත කරන අතර නොමිලේ ලැබෙන ප්‍රකාශන හා ගැසට් ගිණුම්ගත කරනු නොලබයි. | නීත්‍යානුකූල හා අනෙකුත් ලැබීම් නිසි පරිදි වර්ගීකරණය කිරීම වටිනාකම හඳුනාගැනීම, ගිණුම්ගත කිරීම හා අනාවරණය කිරීම |

| | | |
|---|---|---|
| මණ්ඩලයට ලැබී තිබුණු එකතුව රු.111,916,057 ක් වූ මිලදී ගැනීම් වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල පොත් තොගයට ඇතුළත් කර තිබුණි. එසේ වුවත් ආයතනයේ ප්‍රධාන අරමුණු අනුව පොත් ඇතුළු අනෙකුත් ලැබීම් වර්ගීකරණය කිරීම, ඒවායේ වටිනාකම හඳුනාගැනීම හෝ වටිනාකම හඳුනාගැනීමට කටයුතු නොකෙරුණු පොත් ඇතුළු අනෙකුත් ලැබීම් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ ජාතික උරුමයක් ලෙස වර්ගීකරණය කර ඇති පොත් ඇතුළු අනෙකුත් ලැබීම් සම්බන්ධව ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | එසේ වුව ද මණ්ඩලයේ එකතුව තුළට ගනු ලබන සියලු ම පොත්, ගැසට්, පුවත්පත් ආදිය නිසි පරිදි ප්‍රතිග්‍රහණ අංකයක් යටතේ ලේඛනගත කර පරිගණක පද්ධතිය මගින් යාවත්කාලීන ව නඩත්තු කරගෙන යනු ලබයි. | කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී බැංකුව වෙත ලැබී තිබූ එකතුව රු.296,643 ක් වූ ඍජු බැර කිරීම් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | දීර්ඝ කාලයක් තිස්සේ නිවැරදි ව හඳුනාගත නොහැකි ඍජු බැංකු බැර කිරීම් රු. 143,397ක් ආදායම ට ගෙන තිබුණි. | කාලපරිච්ඡේදයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ගබඩා තොග සමීක්ෂණ වාර්තා හා මූල්‍ය ප්‍රකාශන අනුව ගබඩාවේ භෞතික පොත් තොගයේ හා සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ භෞතික පොත් තොගයෙහි පිළිවෙලින් රු.187,686 ක හා රු.1,922,912 ක ඌනතාවයක් නිරීක්ෂණය වුවද එම ඌනතාවය අවසන් තොගයට ගැළපීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොත් තොගයේ වටිනාකම රු.2,110,598 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගබඩා ලේඛනවල සටහන් වී ඇති දෝෂයන් සහ අඩු පිරිවැය නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික තොග සමීක්ෂණයන් සිදුකර නිවැරදි තොග ශේෂයන් ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව දේපල පිරියත හා | පිරිවැය මත ස්ථාවර වත්කම් ගිණුම්ගත කරන බැවින් මිලදී ගන්නා වත්කම් පමණක් | පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳව ජාතික සංචිතය විධිමත්ව හා |

| | | | |
|---|---|---|---|
| | උපකරණ යටතේ පොත් තොගයේ පිරිවැය රු.111,916,057 ක් ලෙස සඳහන් කර තිබුණද, පරිග්‍රහණ ලේඛනය අනුව එම පොත් තොගයේ පිරිවැය රු.45,524,068 ක් ලෙස දක්වා තිබීමෙන් රු.66,391,989 ක වෙනසක් නිරීක්ෂණය වුවද මෙම වෙනස හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | තොගයට ගිණුම්ගත කරන අතර නොමිලේ ලැබෙන ප්‍රකාශන හා ගැසට් ගිණුම්ගත කරනු නොලබයි. | කාර්යක්ෂමව පවත්වා ගැනීමටත් ගිණුම්ගත කිරීමටත් කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසිය 756, 757 | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.111,916,057 කට මිලදී ගත් පොත් තොගය සහ ජාතික පුස්තකාලයේ සංරක්ෂිත පොත් තොගය සමීක්ෂණය කර නොතිබුණි. | පොත් එකතුව කුඩා කාණ්ඩවලින් පැවතීම හා අඛණ්ඩව පාඨක සේවාව සැපයිය යුතු නිසා වාර්ෂිකව එකවර සමීක්ෂණය සිදු නොකරන ලද අතර 2023 වර්ෂයේ සිට අදියර වශයෙන් සමීක්ෂණය කිරීමට අභ්‍යන්තර සැලැස්මක් සකස් කරමින් ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 16(1) වගන්තිය | 2018 වර්ෂයේ සිට Quick Book පරිගණක මෘදුකාංගය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කර තිබුණු මණ්ඩලයේ ගනුදෙනු සම්බන්ධයෙන් වන ලෙජර සටහන් අඛණ්ඩව ,කාලීනව ලෙජර ගිණුම්වල සටහන් කරනු නොලබන අතර 2022 ජුලි 20 දින වන විටත් 2020 ජනවාරි මාසයේ ගනුදෙනු පරිගණක මෘදුකාංගයට | කොවිඩ් වසන්ගත තත්ත්වය යටතේ 2020 හා 2021 වර්ෂවල සාමාන්‍ය රාජකාරි කිරීමට නොහැකි විය. කෙසේ වුවද මේ වන විට 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පවතින අතර 2022 අවසන් වන විට පරිගනක හරහා මූල්‍ය වාර්තා යාවත්කාලීනව පවත්වා ගෙන යා හැක. | විගණන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත් කරන බව විගණනයට නිරීක්ෂණය විය. | | |
| (ඇ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත | | | |
| (i) 12(2)(අ),(ආ) හා (ඉ) වගන්ති | (i) සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන, ප්‍රතිග්‍රහන හා ග්‍රන්ථ විඥාපන පාලන අංශවල ප්‍රගති වාර්තාවලින් පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳව ජාතික සංචිතයක් ලබාදීම, දේශීය හා විදේශීය ප්‍රලේඛන ද්‍රව්‍ය සංචිතයක් පිහිටුවීම, වැඩිදියුණු කිරීම, පවත්වාගෙන යාම හා සංරක්ෂණය සම්බන්ධයෙන් මණ්ඩලයට පැවරී තිබෙන කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය පිළිබිඹු වී නොතිබුණු අතර එම අංශවල එකතුව 40521 ක ඒකක අතරැදී තිබුණි | එම අංශවල මාසික ප්‍රගති වාර්තා නව ආකෘතිය අනුව සැකසීම 2022 සැප්තැම්බර් සිට ආරම්භ කර ඇත. අදාල අංශවල අතරැදි කාර්යයන් ඉටුකරමින් පවතී. | පනත ප්‍රකාරව මණ්ඩලයට පැවරි ඇති කාර්යයභාරය, කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කිරීම හේතුවෙන් එදින සිට සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය පැවති පිරිවැය රු.3,660,547 ක් වූ උපකරණ සහිත රසායනාගාරය ස්ථාපිත ස්ථානයෙන් ඉවත් කිරීම නිසා එහි | නවීන සංරක්ෂණ රසායනාගාරයක් ස්ථාපනය කිරීමට පැවති රසායනාගාරය තාවකාලිකව පිහිටි ස්ථානයෙන් ඉවත් කිරීමට සිදු වුණි. පවතින උපකරණවලින් පොත් බැඳුම්හලේ සංරක්ෂණ කටයුතු පවත්වාගෙන ගියද පුහුණු කාර්ය මණ්ඩලයේ ඌනතාවයක් ද පවතී. සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම හා විධිමත් | පොත් සංරක්ෂණ කටයුතු සඳහා රසායනාගාරයක් අත්‍යවශ්‍ය බැවින් නවීකරණ කටයුතු කඩිනම් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු 2022 සැප්තැම්බර් 30 දක්වාම නතර වී තිබුණි. ඒ හේතුවෙන් අවුරුදු 04 ක කාලයක් රසායනාගාරය තුළින් ඉටුකරනලද පොත් සංරක්ෂණ කටයුතු ප්‍රමාණවත් පරිදි ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | රසායනාගාරයක් ස්ථාපිත කිරීමෙන් අනතුරුව මෙම කාර්යය කාර්යක්ෂමව කිරීම අපේක්ෂාවයි. | |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන දින 738 ක ප්‍රමාදයකින් පසුව 2022 මාර්තු 08 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | කොවිඩ් වසන්ගත තත්ත්වය යටතේ 2020 හා 2021 වර්ෂවල සාමාන්‍ය රාජකාරි කිරීමට නොහැකි විය. කාල පමාවකින් පසුව වුවද අඩු කාර්ය මණ්ඩලයකින් 2019 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ලද ජයග්‍රහනයකි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.376,878,130 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි | යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කරන ලෙසට නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදී. | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඊ) 2012 මැයි 22 දින ප්‍රකාශයට පත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය | මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාට 2010 වර්ෂයේදී නීත්‍යානුකුල නොවන ආකාරයට වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණු රු.247,500 ක් ආපසු අයකර ගෙන පොදු ව්‍යාපාර කාරක සභාවට වාර්තාකරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට නියෝගකර තිබුණද 2022 ජුලි 15 දින | නීතිපති දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීමෙන් පසු කාලාවරෝධී වී ඇති බැවින් අයකිරීමට හැකියාවක් නොමැති බව දන්වා ඇත. එබැවින් එම මුදල අය කර ගැනීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ගේ ඉල්ලීමට අනුව වාරික වශයෙන් වසරක් තුළ | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය ක්‍රියාත්මක කල යුතුය. |

| | | |
|---|---|---|
| | වන විටද එම නියෝගය අනුව කටයුතුකර නොතිබුණි. | මණ්ඩලය වෙත ගෙවීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යැවීමට කටයුතු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,465,100 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,513,944 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,048,844 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට පරිපාලන වියදම් රු.3,147,744 කින් අඩුවීම හා සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ස්වභාවයේ රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන රු.2,162,277 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මුද්‍රණය කරනු ලැබූ රු.2,084,167 ක් වටිනා මණ්ඩලීය ප්‍රකාශන 8,053 ක තොගයක් 2022 ඔක්තෝබර් 03 දිනවන විටත් බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලයීය ප්‍රකාශන ඉතිරි තොග අවම කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. ඉදිරියේදී ග්‍රන්ථ නාමාවලිය හා ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව විවිධ වැඩමුළු හා සම්මන්ත්‍රණවල දී ඉගෙනුම් ද්‍රව්‍ය ලෙස පරිත්‍යාග කිරීමටත්, වැඩසටහන්වලට පැමිණෙන විද්වතුන්ට ලබා දීමටත් නියමිතය. | අවශ්‍යතාවය හඳුනාගෙන මුද්‍රණ කටයුතු සිදුකිරීම හා පවතින පොත් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |